# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2040/3 - 2017 ඔක්තෝබර් මස 09 වැනි සඳුදා - 2017.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : උඳු 2/2/10/61.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 13/96/FR/503.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවයේ විස්තර.*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරඹකැටිය ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි වින්චිෆීල්ඩ්පාර්ක් වත්ත නම් වූ සර්වේ ජනරාල්ගේ අංක මහ 1930 දරන මූලික පිඹුරේ කැබලි අංක 12 දැක්වෙන හෙක්ටයාර් 0.4097ක් වූ ඉඩම.

හිමිකම් කියන අය - ජී. කේ. ජී. පියසේන මයා, වදවලකන්ද, කොබෝනිල්ල.

ඉහත සඳහන් ඉඩමට /පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2017 නොවැම්බර් මස 15 වැනි දින පෙ.ව. 10.00ට උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2017 නොවැම්බර් මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම්/ පරවශ්‍යතාවයන්ට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සුජානි ආර්. විජේතුංග,
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

2017 සැප්තැම්බර් මස 11 වැනි දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 673


1A - G 26386 - 56 (2017/10)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශුද්ධි පත්‍රයයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

*මගේ අංකය* : ඉ/02/34/08/42.
*ඉඩම් අමාත්‍යංශයේ අංකය* : 13/97/ඊ/446.

ර/කලවාන මධ්‍ය මහා විද්‍යාලයට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2011.07.27 දිනැති අංක 1716/21 යටතේ පළවූ අති විශෙෂ *ගැසට් පත්‍රයෙහි* 07 වන වගන්තිය යටතේ විස්තර දක්වෙන දැන්වීමෙහි සඳහන් ඉඩම සම්බන්ධ විස්තර පහත පරිදි සංශෝධනය විය යුතුය.

| අංකඃ RKL/W/2006/639 හා 2011.04.24<br>දිනැති සංශෝධනයට පෙර පිඹුර අනුව අ.ග.සි. 244හි<br>අතිරේක අංකඃ 27 හා පත්‍ර අංකඃ 29 | අංක RSS/KLW/2012/390 හා 2012.10.23<br>දිනැති සංශෝධිත පිඹුර අනුව අ.ග.සි. 244 හි<br>අතිරේක අංක 27 හා පත්‍ර අංක 29 |
|---|---|
| අ.ග.සි. 244 හි කැබලි අංකඃ 845 ඉඩමේ ප්‍රමාණය - හෙක්ඃ 0.0326 | අ.ග.සි. 244 හි කැබලි අංකඃ 853 ප්‍රමාණය - හෙක්ඃ 0.0273 |
| අ.ග.සි. 244 හි කැබලි අංකඃ 846 ඉඩමේ ප්‍රමාණය - හෙක්ඃ 0.3668 | අ.ග.සි. 244 හි කැබලි අංකඃ 854 ප්‍රමාණය - හෙක්ඃ 0.0338 |
| අ.ග.සි. 244 හි කැබලි අංකඃ 847 ප්‍රමාණය - හෙක්ඃ 0.7344 | අ.ග.සි. 244 හි කැබලි අංකඃ 855 ප්‍රමාණය - හෙක්ඃ 0.3571 |
| අ.ග.සි. 244 හි කැබලි අංකඃ 848 ප්‍රමාණය - හෙක්ඃ 0.0789 | අ.ග.සි. 244 හි කැබලි අංකඃ 856 ප්‍රමාණය - හෙක්ඃ 0.7218 |
| | අ.ග.සි. 244 හි කැබලි අංකඃ 857 ප්‍රමාණය - හෙක්ඃ 0.0727 |

ජී. ඩී. එල්. උදයකුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
කලවාන.

2017 සැප්තැම්බර් මස 25 වැනි දින,
කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 674

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.